**නිපුණතාවය :-** කුඩා පරිමාණ ව්‍යාපාරයක ව්‍යවසායකයකු විසින් ඉටු කරන භූමිකා විමර්ශණය කරයි.

**නිපුණතා මට්ටම :-** ව්‍යවසායකත්වය සහ කුඩා පරිමාණ ව්‍යාපාර අතර ඇති සබඳතාව අනාවරණය කරයි.

**( පෙළ පොතේ පිටු අංක 48 හොඳින් කියවා පහත ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න)**

(01) ආර්ථික සංවර්ධනයට කුඩා පරිමාණ ව්‍යාපාර දායකත්වය සපයන **ආකාර** 04 ක් දක්වන්න.

(02) ග්‍රාමීය ප්‍රදේශවල කුඩා පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමෙන් සේවා **වියුක්තිය** අඩුවන්නේ කෙසේ ද ?

(03) රටේ ජාතික නිෂ්පාදනය ඉහල දැමීමට කුඩා පරිමාණ ව්‍යාපාර ද වැදගත් වේ. විමසන්න ?

(04) පුද්ගලයන් අතර ආදායම් බෙදීයාමේ විෂමතාවය ට විසඳුමක් ලෙස කුඩා පරිමාණ ව්‍යාපාර ආරම්භයට සහයවීම සඳහා සහනදායී ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක වේ.

i. එවැනි සහණදායී ණය සපයන ආයතන 02 ක් දක්වන්න.

ii. විරැකියාවෙන් පසුවන්නන් සඳහා ස්වයං රැකියා ලබාදීමෙන් ආදායම් බෙදීයාමේ විෂමතාවය අඩුකරගත හැකි ද ?

iii. රැකියා විරහිත තරුණ තරුණියන් ස්වයං රැකියා සඳහා පෙළඹවීම සඳහා ඔබ කරන යෝජනා 02 ක් දක්වන්න.

(05) නවීන යන්ත්‍රසූත්‍ර පැමිණීම නිසා ඇතැම් **දේශීය කර්මාන්ත** වැසීයාමට ලක්වේ. ඔබ දන්නා එවැනි කර්මාන්ත02 ක් දක්වන්න.

(06) මහා පරිමාණ ව්‍යාපාර අවධානය යොමු නොකරන **'වෙළඳපල හිදැස'** පියවීමට කුඩා පරිමාණ ව්‍යාපාර වැදගත්වන ආකාරය පැහැදිලි කරන්න.